2024 අගෝස්තු

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන සහ සේවා


STATISTICS DEPARTMENT
CENTRAL BANK OF SRI LANKA

## 2024 අගෝස්තු මාසයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන හා සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි

**නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2024 අගෝස්තු මාසයේ දී දර්ශකාංක 55.5ක් වාර්තා කරමින් පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වුව ද නිෂ්පාදන ක්‍රියාකාරකම්වල වර්ධනයක් පිළිබිඹු කරනු ලැබීය.** මෙහිදී, සේවා නියුක්තිය හැර අනෙකුත් සියලුම උප දර්ශක කඩයිම් මට්ටමට වඩා ඉහළ අගයක් වාර්තා කරන ලදී.

නව ඇණවුම් සහ නිෂ්පාදන ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශය දායක විය. තවද, නව ඇණවුම් සහ නිෂ්පාදනවල වර්ධනය අනුව යමින් මෙම මාසය තුළ දී තොග මිල දී ගැනුම් ද ඉහළ ගියේය. කෙසේ වෙතත්, අගෝස්තු මාසයේදී සේවා නියුක්තිය පසුගිය මාසයට සාපේක්ෂව පහත වැටුණි. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අගෝස්තු මාසයේ දී ද ඉහළ මට්ටමක පැවතුනි.

**නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**
**55.5**
**2024 අගෝස්තු**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචලයය | ජූලි | අගෝ. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **59.5** | **55.5** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| නව ඇණවුම් | 62.0 | 58.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 61.5 | 59.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 54.0 | 45.0 | - | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| තොග මිලදී ගැනුම් | 60.5 | 56.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 57.6 | 56.2 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසරේ අවසන් කාලයේ දී ඇතිවන ඉල්ලුම ඉහළ යෑම පිළිබඳ බලාපොරොත්තු හේතුවෙන්, ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන ක්‍රියාකාරකම් සඳහා වූ අපේක්ෂා මැනිවරණ වාතාවරණය තුළ පවතින අවිනිශ්චිතතා මධ්‍යයේ වුවද, ධනාත්මක මට්ටමක පවතී.

### ගෝලීය ප්‍රවණතා
### නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| ඉන්දියාව | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | සමාන වේගයකින් පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2024 සැප්තැම්බර් 18 වන දිනට (PMI Releases (spglobal.com))*

[1] *එස් &පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, එනම් ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, 2024 අගෝස්තු මාසයේ දී දර්ශකාංක 65.2ක් වාර්තා කළේය.** මෙමගින් පෙර මාසයට සාපේක්ෂව අගෝස්තු මාසයේ දී සේවා ක්‍රියාකාරකම්වල මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරයි.

ව්‍යාපාර ක්‍රියාකාරකම් ඉහළ යෑම සඳහා බොහෝ අංශයන්හි සිදු වූ වර්ධනයන් හේතු විය. ඒ අනුව, අනෙකුත් පෞද්ගලික සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් ඉහළ ගිය අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන්, පොදු විනෝදාත්මක කටයුතුවල ඇති වූ වර්ධනයන් හේතු විය. තවද, තොග සහ සිල්ලර වෙළෙඳාම, ප්‍රවාහන සේවා සහ මූල්‍ය සේවා කටයුතු හා සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් ද අගෝස්තු මාසයේ දී සැලකිය යුතු වර්ධනයන් පෙන්නුම් කරන ලදී. එසේ වුවද, විදුලි සංදේශ, දේපළ වෙළදාම සහ තොරතුරු තාක්ෂණ වැඩසටහන් උපදේශනය හා සම්බන්ධ ක්‍රියාකාරකම් පෙර මාසයේ පැවති මට්ටමේම පැවැති අතර අනෙකුත් සියලුම අංශවල ක්‍රියාකාරකම් වර්ධනයන් වාර්තා කරන ලදී.

ප්‍රධාන වශයෙන්, අනෙකුත් පෞද්ගලික සේවා සහ මූල්‍ය සේවා කටයුතුවල සිදු වූ වර්ධනයන් සමග, අගෝස්තු මාසයේ දී නව ව්‍යාපාරවල වැඩිවීමක් දක්නට ලැබුණි.

පෙර මාසයේදී මෙන්ම අගෝස්තු මාසයේදී ද සේවා නියුක්තිය තවදුරටත් සුළු වශයෙන් පහළ ගියේය. කෙසේවෙතත්, පසුගිය මාස විසිහතර තුළ පෙන්නුම් කළ අඛණ්ඩ පහත වැටීමකින් පසුව අගෝස්තු මාසයේ දී නිම කිරීමට නියමිත කාර්යයන් වර්ධනය විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | ජූලි | අගෝ. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** (**ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය**) | 71.1 | 65.2 | - | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| නව ව්‍යාපාර | 66.2 | 61.2 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 49.0 | 48.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 48.4 | 51.1 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 74.7 | 68.8 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පවත්නා හිතකර සාර්ව ආර්ථික තත්ත්වයන්ට සමගාමීව, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා වූ අපේක්ෂාවන්, අගෝස්තු මාසයේ දී අඩු වේගයකින් වුවද ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** **65.2**

**2024 අගෝස්තු**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා

### සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2024 සැප්තැම්බර් 18 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ හරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.